**බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව,**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

--------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 08 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බුලත්කොහුපිටිය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් සහ අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළ මිලදීගත් ගබඩා ද්‍රව්‍ය වලින් සැපයුම් හා උපකරණ ගිණුමටගැලපිය යුතු, රු.684,023 ක් දෝෂ සහගත ලෙස ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැරකර තිබුණි. මේ නිසා වර්ෂයේ ඌනතාවය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. .

(ආ) වර්ෂය තුළ මිලදීගත් ලිපි ද්‍රව්‍ය වලින් සැපයුම්හා උපකරණ ගිණුමේ ගැලපිය යුතු රු.176,425 ක් දෝෂ සහගත ලෙස ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට බැරකර තිබුණි. මේ

හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමඑම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ විගණනය විසින් පෙන්වා දී තිබුණු ගබඩා ද්‍රව්‍ය හා ලිපි ද්‍රව්‍ය වැරදි ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේ සමුච්චිත අරමුදලට ගැලපිය යුතු එකතුව රු. 286,087 ක් වැරදි ලෙස සැපයුම් හා උපකරණ ගිණුමට බැර කිරීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ විගණනය විසින් පෙන්වා දී තිබුණු පරිත්‍යාග ලෙස ලැබුණු ලී බඩු රු.149,608 ක් වැරදි ලෙස ප්‍රාග්ධන ආධාර ගිණුමට බැර කිරීම නිවැරදි කිරීම සඳහා 2014 වර්ෂයේදී සමුච්චිත අරමුදලට හර කළ යුතු එම මුදල ප්‍රාග්ධන ආධාර ගිණුමට හර කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පෞද්ගලික නමට නිකුත් කරන ලද වටිනාකම රු. 123,070 ක් වූ භාණ්ඩ , ලීබඩු හා සවි කිරීම් ගිණුමෙන් ඉවත් කිරීමෙන් එම ප්‍රමාණයෙන් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සභාව වෙත 2013අගෝස්තු සිට 2014 අගෝස්තු දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.3,258,147 ක් වුවද එය ආදායම් ලෙස හා ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ලී බඩු හා උපකරණ විෂයයන් 14 ක වටිනාකම රු.140,715 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) සභාව වෙත කෑගල්ල හා රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණ මඟින් උසාවි දඩ ලෙස ලැබිය යුතු එකතුව රු. 430,217 ක ආදායමක් ලෙස හා ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) ස්ථාවර වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර වෙනස සොයා බැලීමට කටයුතු නොකර රු.951,856 ක් සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුමට හර කර තිබුණු අතර තවදුරටත් පැවති රු.630,134 ක් පිළිබඳව නිසි ගැලපීම් කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී ලේඛනාගාරයේ රාක්ක ඉදිකිරීම සඳහා වැයකර තිබුණු රු.145,986 ක මුදල ලීබඩු හා සවිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කළයුතු වුවද, එය සැපයුම් හා උපකරණ යටතේ ලියා හැරීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) වර්ෂය තුළ ලැප්ටොප් වර්ගයේ පරිගණකයක් මිලදී ගැනීම වෙනුවෙන් සභා අරමුදලින් රු.50,100 ක් ගෙවීම් කර තිබුණු අතර එය යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට සැපයුම් හා උපකරණ යටතේ වර්ෂයේ වියදම් ලෙස ලියාහැර තිබුණි.

(ක) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් 2014 වර් ෂයටඅදාල පොලිය රු. 296,509 ක් හා ණය වාරිකය රු.450,388 ක් විය. එයින් වර්ෂයට අදාල පොලිය පමණක් රු. 296,509 ක පොලී වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගෙවිය යුතු මුළු මුදලම වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා රු. 450,388 කින් වර්ෂයේ ඌනතාවය වැඩියෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 98,211 ක බැරකම් සඳහා වෙන්කිරීම් කර නොතිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම

------------------------------

ගිණුම් විෂයයන් 07 ට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 17,778,653 වූ අතර ඊට අදාල උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිනුම් ශේෂයන්ගේ එකතුව රු.17,877,227 ක් වූයෙන් වෙනස රු.98,574 ක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට, ලැබිය යුතු අවුරුදු 03 සිට 06 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 24,443 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 3,588,424 ක් විය.

1.3.4 <u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ.571 | 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාල රු.6,138,845 ක් වූ කල් ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.මෙම තැන්පත් මුදල තුළ පොදු වෙළඳපල කඩ කාමර පෙර විකුණුම් පදනම මත බදු මුදල් වූ රු. 4,757,859 ක් ද වන අතර එම මුදල් කඩ කාමර ඉදි කිරීම සඳහා වැය කර ඇති බවත් එය තැන්පත් ගිණුම හරහා නිරවුල් වී නොමැති බවත් අනාවරණය විය. |
| (ආ) සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය | |
| 261.2.2 රීතිය | 2012 සැප්තැම්බර් මස ගෙවා තිබූ රු.69,038 ක මුදලක් විගණන අවස්ථාව වන විටත් පියවා නොතිබුණි. |
| 283.4 රීතිය | එකතුව රු.43,824 ක් වූ නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006<br>3.9.1 වගන්තිය | මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා රු.3,244,642 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එකී ඉදිකිරීම් කටයුතු සඳහා රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු බව අවධාරණය වී තිබියදී ඊට පටහැනි ලෙස අනුමත සමිති වෙත ලබාදිය හැකි උපරිම සීමාව රු.2,000,000 ඉක්මවා ඉදිකිරීම කොටස් 4කට වර්ගකර ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව අනුමත සමිති 4 කට කොන්ත්‍රාත් ලබාදී තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 4,513,231ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූආදායම රු1,352,552 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,865,783 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,865,783 ක පිරිහීමකට ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 06 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2014.12.31 දිනට හිගය

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂ යේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් අයවීම | වර්ෂයේ බිල් කිරීම් වලින් හිහය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| i වරිපනම් හා බදු | 190 | 119 | 1,061 | 975 | 71 | 96 | 167 |
| ii බදු කුලී | - | - | 2,540 | 2540 | - | - | - |
| ii බලපත්‍ර ගාස්තු | - | - | 190 | 190 | - | - | - |
| Ivවෙනත් ආදායම් | - | | 80 | 633 | - | - | - |

සභාව විසින් ලබාදුන් හිග ආදායම් වාර්තාවට අනුව වරිපනම් හා බදු වලින් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂ රු. 167,000 ක් වුවත් ගිණුමට අනුව එම ශේෂය රු. 226,068ක් විය.

2.3.2 වරිපනම් බදු

---------------

වර්ෂ 01 සිට වර්ෂ 09 දක්වා රු.92,297ක් වූ වරිපනම් බදු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 දැන්වීම් පුවරු ගාස්තු

-------------------------

සමාලෝචිත වර්ෂයේ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම අවම මට්ටමක පැවතුණු අතර, දැන්වීම් පුවරු 10 ක් සඳහා රු.15,065 ක අවම ආදායමක් පමණක් අයකර තිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා.

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව මගින් අළුතින් ඉදිකරන ලද පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 10 ක් 2011 වර්ෂයේ සිට බදු දී තිබූ අතර, එම කඩ කාමර ඉදිකිරීම සඳහා පෙර මුදල් වශයෙන් රු. 10,190,000 ක් ලබාගෙන තිබුණි.2010 නොවැම්බර් 03 දිනැති සබරගමුව පළාත් තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව උඩුමහලේ කඩකාමරයක් රු. 5,000 බැගින්ද, පහත මාලයේ කඩකාමරයක් රු. 7,500 බැගින්ද බදු දීම නිර්දේශ කර තිබූ අතර ,මෙම තක්සේරුව වර්ෂ තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන බවද සඳහන් කර තිබුණි.කෙසේ වෙතත් 2010 නොවැම්බර් මස 24 වන දින පැවැත්වූ මහා සභාවේදී එක් කඩ කාමරයක් රු. 1,250 බැගින් අයකිරීමට ඒකමතිකව තීරණය කර තිබූ බැවින් 2011 ජනවාරි මස සිට 2014 දෙසැම්බර් දක්වා කඩ කාමර බදු දීමෙන් රු. 2,400,000 ක පාඩුවක් සභාවට සිදු වී තිබුණි.

(ආ) පෙර පාසලක් හා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට රු.30,000,000 ක මුදලක් පෞද්ගලික ඉඩම්හිමිකරුවකුට ගෙවා ඇතත් ,ඉඩම මිලදී ගැනීමේ දී ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර ,එය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

3.2 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු. 47,700ක්වූසේවක ඇප තැන්පතු මුදල් එක් එක් නිලධාරීන්ගේ ඉතිරිකිරිමේ ගිණුම් පොත්වල තැන්පත් කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයනොවී පැවති එකතුව රු.56,380 ක් වූ සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 මැයි 21 දින පරිසර අමාත්‍යංශයෙන් කසළ බඳුන් මිලදී ගැනීම සඳහා ලද රු.30,000 ක මුදල අදාල කාර්යය සිදු නොකර 2014 වර්ෂයේ ආදායමට ගෙන තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පෞද්ගලික රබර් වත්තට පිවිසුම් මාර්ගයක් වන ඌරුමීවල අච්මිර්වත්ත හරහා පේරගස් හංදිය පාර මාර්ගය කිසිදු ප්‍රතිලාභියෙකු නොමැතිව රු. 196,450 ක් වැය කරමින් අඩි 105 දිගට කොන්ක්‍රීට් යොදා තිබුණි.

(ආ) අමුවක්ක දේවාල පාර කොන්ක්‍රිට් කිරීම හා පැති බැම්ම ඉදි කිරීම යටතේ දේවාල පාර ආරම්භ වන ස්ථානය දකුණු පස පිහිටි නිවසේ මිදුලෙහි රු. 100,000 වැය කරමින් මීටර් 6 ක් දිගැති පැති බැම්මක් ඉදි කර තිබුණි. පැති බැම්ම සඳහා "6 x 9" ගල් යොදා ගත යුතු වුවත් ඊට වඩා විශාල ප්‍රමාණයේ ගල් යොදාගෙන තිබුණු බවත් පැති බැම්ම නිමාවකින් තොරව ඉදිකර තිබුණු බවත් 2015 මාර්තු 18 දිනැති ක්ෂේත්‍ර පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ වීදාච්චි හේන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.700,000 ක් අනුමත වී තිබුණු අතර එම මුදල් වැය කරමින් එම මාර්ගයේ බෑවුම් සහිත වංගුවක් සඳහා මීටර් 11.9 ක් දිග කොන්ක්‍රීට් පැති බැම්මක් ඉදිකර තිබුණු අතර එම පැතිබැම්ම මතු පිට කොටස් වල " මී වද " වැනි පළුදු විශාල ප්‍රමාණයන් දක්නට ලැබුණ අතර කොන්ක්‍රීට් යෙදීමට පෙර යොදන ලද හැඩයම් ලෑලි නියමිත පරිදි සවි නොකිරීම නිසා මතුපිට කොටස්වල මෘදු නිමාවකින් තොරව පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) රු. 100,000 ක් වැය කරමින් අධික බෑවුම් සහිත යටවත්ත අතුරු මාර්ගයේ අඩි 54 ක් කොන්ක්‍රීට් යොදා තිබුණි. එහෙත් එම මාර්ගය දිගේ ජලය ගලා යාම නිසා කොන්ක්‍රීට් කොටසක් සේදී ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) රු.100,000 ක් වැය කරමින් වියලවත්ත මාර්ගය අඩි 54 ක් කොන්ක්‍රීට් කර තිබුණු අතර මාර්ගයේ බර වාහන යාම නිසා ආරම්භක ස්ථානයේ ස්ථාන 4 ක් කැඩී ගොස් තිබුණි. එමෙන්ම බර වාහන යාම වැලැක්වීමට මාර්ගයේ පුවරුවක් සවිකර නොතිබුණි.

(ඊ) රු.3,244,642 ක් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය ඉදිකිරීම අනුමත සමිති වෙත පවරා තිබියදී කිසිදු අනුමැතියකින් තොරව සවලීකරණ (mobilization) අත්තිකාරම් ලෙස ගිවිසුම් වටිනාකමින් 20% මුදලක් ගෙවා තිබුණද ඒ සඳහා ඇපකර කිසිවක් ලබා ගෙන නොතිබුණි.

(උ) මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති හා ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් 2012 මැයි 30 දින අත්සන් තබන ලද ගිවිසුම් පත්‍රයෙහි 2.22 වගන්තිය පරිදි ඉදිකිරීම් නිම කර සති 2 ක් තුළ කොම්පෝස්ට් නිපදවීම ආරම්භ කළ යුතු බවට එකඟ වී තිබියදී 2013 ජූනි 8 දින වැඩ අවසන් කර තිබුණු කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2015 මාර්තු 18 දින දක්වා කොම්පෝස්ට් නිපදවීම ආරම්භ කර නොතිබුණි.

(ඌ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ ප්‍රාදේශීය සභාව වෙත රු 3,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ලාභ අරමුණු කරගත් ඇස්තමේන්තු පිළියෙල නොකළ යුතු අතර ඍජු ශ්‍රමය යොදාගෙන සභාවේ නඩත්තු ඒකකය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතු වුවත්, පන්නල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීම සඳහා පන්නල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත 2014 නොවැම්බර් 24 දින රු.176,516ක් හා 2014දෙසැම්බර් 17 දින රු. 246,368 ක් ලෙස රු. 422,884 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි.

එමෙන්ම මෙම මුදල් හඳුනාගන්නා ලද වෙන ව්‍යාපෘති සඳහා පමණක් වැයකළ යුතු වුවත් ඊට පටහැනි ලෙස සභාවේ සමාන්‍ය වියදම්සඳහාරු. 362,152 ක් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබුණි.

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

1988 මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

### 4.2 අයවැය පාලනය.

2014 අයවැය ලේඛනය මඟින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදන වලින් අවස්ථා 11 කදී එකතුව රු.39,600 ක් වූ මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබුණි.

05. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය